සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# නාට්‍ය හා රංග කලාව

**8 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රකාශයන් හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන තුළ යොදන්න.**

01 වේදිකා නාට්‍යයකට නාට්‍ය පෙළක් අනිවාර්ය වේ. ( )

02 අංග රචනය හා වේෂ භූෂණය අනුශාංගික කලා නොවේ. ( )

03 නව නිර්මාණයක් බිහිකිරීමට පරිකල්පනය අවශ්‍ය වේ. ( )

04 වේදිකා නාට්‍ය කලාව සාමූහික කලාවක් නොවේ. ( )

05 නාට්‍යයක් ප්‍රේක්ෂකයා වෙත රැගෙන යනුයේ සතර අභිනය මාධ්‍යයෙනි. ( )

- **අංක 06 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

06 නාට්‍ය පෙළක මූලිකාංගයක් වනුයේ,

(i) සංවාද (ii) අභිනය (iii) නළු නිළියන් (iv) අනුශාංගික අංග

07 සතර අභිනයට අයත් නොවන්නේ,

(i) ආංගික (ii) වාචික (iii) රංග විධාන (iv) ආහාර්ය

08 සංවේදන අභ්‍යාසයකදී යොදාගන්නේ,

(i) ඇස (ii) කට (iii) දිව (iv) මනස

09 නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීමේ දි සැළකිලිමත් විය යුත්තේ,

(i) රංග විධාන යෙදීමට (ii) අනුශාංගික කලා යෙදිමට

(iii) පාත්‍ර වර්ගයා යොමුකිරීමට (iv) ආලෝකකරණය සැකසීමට

10 රංග ක්‍රීඩාවකි

(i) අභිරූපණ (ii) ගස් දෙකේ යුද්ධය

(iii) දර්පණ අභ්‍යාස (iv) ශිථිලකරණ අභ්‍යාස

11 ''බුද්ධ ගජ්ජය'' ඇසුරින් ප්‍රගුණ කරනු ලබන අභ්‍යාස වන්නේ,

(i) තාපන අභ්‍යාස (ii) කටහඬ අභ්‍යාස

(iii) ශිථිලකරණ අභ්‍යාස (iv) රිද්මයානුකූල අභ්‍යාස

12 ජන ගී වලට අයත් නොවන්නේ,

(i) කරත්ත කවි (ii) යාතුකර්ම කවි (iii) භක්ති ගීත (iv) පැල් කවි

13 ''ඇහැල මලින් ගස් පිරිලා'' කුමන වේදිකා නාට්‍යයකට අයත් වේද?

(i) නරි බෑණා (ii) තලමල පිපිලා (iii) මනමේ (iv) මකරා

14 ''කැලේ හරිම ලස්සනයි

දිය ඇලි හෙමිහිට ගලයි''

මෙම ගීතය ඇතුලත් නාට්‍ය වනුයේ,

(i) වළහා හා මාෂා (ii) පුංචි අපට දූන් තේරෙයි

(iii) සෙල්ලම් ලෙල්ලම් (iv) තොප්පි වෙළෙන්දා

15 යම් චරිතයකට වෙස්වලාගැනීමත්, එම චරිතයට ආරූඪවීමත් හඳුන්වන්නේ,

(i) සතර අභිනය (ii) සමාරෝපය (iii) සාත්වික අභිනය (iv) රංග විධාන

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

16 වේදිකා නාට්‍ය රංගනය සඳහා යොදාගනු ලබන ස්ථානය ........................................................................ නම් වේ.

17 වේදිකා නාට්‍ය දර්ශනයක දී වැදගත්ම පිරිස වනුයේ ........................................................................ න් ය.

18 ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වනුයේ ........................................................................ යි.

19 වේදිකා නාට්‍යයක දි ඇඳුම් පැළඳුම්, අංග රචනය ........................................................................අභිනයට අයත් වේ.

20 පෙර සූදානමකින් තොරව එම මොහොතේ දෙන ලද මාතෘකාවකට රංගනය කරනුයේ ........................................................................ යි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01 පහත දී ඇති සංවාද ඛණ්ඩය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A : කවුද මේ ...

B : මම මේ මහ මූකලානේ පාර වැරදිලා පාර සොයාගන්න මෙහෙට ආවේ.

A : (බයෙන්) බොරු කියන්න එපා. මායාකාර කෙල්ලක්. මායාකාර හඬක්. මොකද එහෙම කෑ ගැහුවේ.

B : වලස් රාළහාමී මගේ අත පැගුවා. ඒකයි කෑ ගැහුවේ.

A : (කල්පනා කරයි) මායාකාරියක් නොවෙයි ද? මට හරියට දැන ගන්න ඕනා. බය වෙන්න නරකයි. යන්න ඕනා ළඟට.

(i) මෙම දෙබස් කාණ්ඩය අයත්වන නාට්‍ය නිර්මාණයේ නම කුමක් ද? (ල. 02)

(ii) එය නිර්මාණය කළේ කා විසින් ද? (ල. 02)

(iii) මෙහි ඇතුලත් රංග විධාන 2 ක් ලියා දක්වන්න. (ල. 02)

(iv) මෙම නාට්‍යයේ තේමාව කුමක් ද? (ල. 02)

(v) මෙම නාට්‍යයෙන් ලබාදෙන ආදර්ශ 2 ක් ලියන්න. (ල. 02)

02 (i) නාට්‍ය පෙළක් යනු කුමක් ද? (ල. 02)

(ii) නාට්‍ය පෙළක අන්තර්ගත විය යුතු මූලිකාංග 3 ක් ලියන්න. (ල. 03)

(iii) නාට්‍ය තේමාව යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ල. 05)

03 (i) රංග අභ්‍යාස යන්න හඳුන්වන්න. (ල. 02)

(ii) රංග අභ්‍යාස කිරීමෙන් නළුවාට ලැබෙන ප්‍රයෝජන 3 ක් ලියන්න. (ල. 03)

(iii) ඔබ කැමති රංග අභ්‍යාසයක් නම්කර එය ප්‍රායෝගිකව සිදුකරන ආකාරය කෙටියෙන් ලියා දක්වන්න. (ල. 05)

04 (i) ආගමික කථා යනු කුමක් ද? (ල. 02)

(ii) ජාතක කථා ආශ්‍රයෙන් නිර්මාණය වූ නාට්‍ය 3 ක් නම් කරන්න. (ල. 03)

(iii) ආගමික කථා ආශ්‍රයෙන් නිර්මාණය වූ නාට්‍යවල දක්නට ලැබෙන සාරධර්ම ලක්ෂණ පැහැදිලි කරන්න. (ල. 05)

05 ''සමගිය බල වේ'' යන අදහස ඉස්මතු වන සේ නාට්‍ය තේමාවක් තෝරා ගනිමින් ඔබට අභිමත පරිදි ඊට චරිත යොදාගනිමින් කෙටි නාට්‍ය පෙළක් රචනා කරන්න. (ල. 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | ✓ | (02) | × | (03) | ✓ | (04) | × | (05) | ✓ | (06) | i | (07) | iii |
| (08) | iv | (09) | i | (10) | ii | (11) | ii | (12) | iii | (13) | i | | |
| (14) | i | (15) | ii | (16) | වේදිකාව | (17) | ප්‍රේක්ෂකයන් | (18) | රූපවාහිනිය | | | | |
| (19) | ආහාර්ය අභිනය | (20) | ක්ෂණික නිරූපණ | | | | | | | | | | |

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

01 (i) වළහා හා මාෂා (ල. 02)

(ii) ඩී. කුමාරගේ මහතා (ල. 02)

(iii) බයෙන්, කල්පනා කරයි, වළහා මාෂා ළඟට යයි (ල. 02)

(iv) වැඩිහිටියන්ට අකීකරු වීම නිසා කරදරයට පත් වූ ගැහැනු දරුවකු වන ''මාෂා'' චරිතය වටා නිර්මාණය වූ කතාවකි. (ල. 02)

(v) 1. අවිහිංසාවාදී විය යුතුය. 2. වයසට සරිලන විවිධ හැකියාවන් ලබා තිබිය යුතුය.
3. අන්සතුදේ සොරා ගැනීම නුසුදුසු බව 4. පිළිවෙලකට වැඩ කළ යුතු බව
5. අකීකරු නොවීම (ල. 02)

02 (i) වේදිකාවක රඟ දැක්වීමට උචිත වූ අයුරින් යම් නිර්මාණකරුවෙකු (රචකයෙකු) විසින් රචනා කරන ලද ලිඛිත වූ සාහිත්‍යමය කොටස නාට්‍ය පෙළ නම් වේ. (ල. 02)

(ii) 1. නාට්‍යෝචිතව සිද්ධි පෙළ ගැස්වීම 2. රංග විධාන යොදාගැනීම
3. ප්‍රබල සංවාද යොදාගැනීම 4. චරිත යොදාගැනීම
5. මුල, මැද, අග සම්බන්ධතාව රැකෙන පරිදි අවස්ථා ගැළපීම (ල. 03)

(iii) නාට්‍ය තේමාව යනු සමස්ථ නාට්‍ය පෙළෙන් ප්‍රකාශවන අදහසයි. තේමාවක් සහිතව මනාව ගලපන ලද කථා වස්තුවක් නිර්මාණය විය යුතුය. උදාහරණ සහිතව ලියා ඇති කරුණුවලට ලකුණු ලබාදෙන්න. (ල. 05)

03 (i) රංග අභ්‍යාස යනු ආධුනික නළුවෙකු රංගනයට පිවිසීමට පෙර තම කායික හා මානසික සමබරතාවය ඇතිකර ගැනීම සඳහා සිදුකරන අභ්‍යාස වේ. (ල. 02)

(ii) 1. විනෝදාශ්වාදයක් ලබාගැනීම
2. සබකෝලය දුරුවීම
3. රංගනයට උචිත පරිදි ශරීරය හසුරුවා ගැනීම
4. රංගනයට උචිත හඬක් නිර්මාණය කර ගැනීම (ල. 03)

(iii) පංති කාමරයේ ඉගැන්වීම් සිදුකළ අභ්‍යාසයක් කෙටියෙන් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 05)

04 (i) විවිධ ආගම් ආශ්‍රයෙන් බිහි වූ ආගමික ලක්ෂණ ඇතුළත් චරිත හා සිද්ධි ඇතුලත් කථා ආගමික කථා වේ. මේවා තුළ ඒ ඒ ආගම්වලට අයත් කථා සාහිත්‍යයක් දක්නට ලැබේ. (ල. 02)

(ii) 1. කදාවළලු - සේරිවාණිජ ජාතකය
2. ලෝමහංස - ලෝමහංස ජාතකය
3. මනමේ - චුල්ල ධනුද්ධර ජාතකය
4. පබාවතී - කුස ජාතකය (ල. 03)

(iii) ජාතක කථා (බෞද්ධ කථා) හා අන්‍ය ආගමික කථා ඔස්සේ ගොඩනැගුණු කථාවන්හී සාරධර්ම ලක්ෂණ ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (උදා- හිංසා, පීඩා නොකිරීම / විඩිහිටියන්ට ගරු කිරීම / අසරණ අයට පිහිට වීම) (ල. 05)

05 1. මාතෘකාව
2. චරිත, සංවාද
3. රංග විධාන
4. ගැටුම් අවස්ථා (නාට්‍යෝචිත අවස්ථා)

ඇතුළුව නාට්‍ය පෙළ නිර්මාණය කොට ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න. (ල. 10)